345

RARE

# බෙලිගල දළදා පෙරහැර
# තුළින් නිරූපණය වන සාම්ප්‍රදායික
# සිරිත් විරිත් හා අභිචාර ක්‍රම පිළිබඳ
# සමාජ විද්‍යාත්මක විමර්ශනයක්

බෙලිගල දළදා පෙරහැර තුළින් නිරූපණය වන සාම්ප්‍රදායික
සිරිත් විරිත් හා අභිචාර ක්‍රම පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්

(කෑගල්ල බෙලිගල ග්‍රාමය ආශ්‍රිත අධ්‍යයනයකි.)

*ජේ. ඒ. සුමිත් ආනන්ද*
***SOCI/M/02R/97***

කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ සමාජ විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන ස්වාධීන පර්යේෂණ නිබන්ධනය.

**2003** අගෝස්තු

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 345 |
| වර්ග අංකය | |

*සමාජ විද්‍යා අධ්‍යනාංශය*
*කැලණිය විශ්ව විද්‍යාලය*
*ශ්‍රී ලංකාව*

## 1.2 නිබන්ධ සාරාංශය

බෙලිගල ග්‍රාමය ආශ්‍රිතව ඈත අතීතයේ සිට වර්තමානය දක්වා පවත්වා ගෙන එනු ලබන දළදා පෙරහැර පිළිබඳවත්, ඒ මගින් සමාජයට කෙරෙන බලපෑම පිළිබඳවත් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය විය. ඒ අනුව සිදු කළ තොරතුරු ගවේෂණය ඇසුරින් ලබා ගත් දත්ත මත ලියන ලද පරිච්ඡේද වලදී සැලකිල්ලට ගත් කරුණු හා විශ්ලේෂණය කළ තොරතුරු පහත දැක්වෙන පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකිය.

පළමු වන පරිච්ඡේදයේ පර්යේෂණ මාතෘකාව හා එහි පසුබිම පිළබඳව එහි අන්තර්ගත සමාජ විද්‍යාත්මක හා සමාජ මානව විද්‍යාත්මක වැදගත්කම් පිළබඳ කෙටි හැඳින්වීමක් ඇතුළත් කොට තිබේ. එසේම මවිසින් තෝරාගත් පර්යේෂණ ක්ෂේත්‍ර, දත්ත රැස් කිරීම සඳහා යොදා ගත් ක්‍රමවේදයද මෙහි අන්තර්ගතය අතර වෙයි.

මෙම පර්යේෂණ නිබන්ධනයේ දෙවන පරිච්ඡේදය වෙන් කොට ඇත්තේ ආගම හා අභිචාර පිළිබඳ මූලාශ්‍රගත තොරතුරු පිළිබඳව විග්‍රහ කිරීම සඳහාය. ඒ යටතේ ආගම හා අභිචාර වල කෘත්‍යයන් පිළිබඳවත්, ජන ආගම පිළිබඳවත් සවිස්තර තොරතුරු අන්තර්ගත වී ඇත. ඒ යටතේ ආගම නිර්වචනය කොට ඇති අතර ආගම හා අභිචාරමය පුද පිළිවෙත් පිළිබඳ සංකල්පමය රාමුව සහ එහි අන්තර්ගතය කෙටියෙන් සාකච්ඡා කොට තිබේ.

තෙවැනි පරිච්ඡේදයේදී ක්ෂේත්‍ර අධ්‍යයනය ආශ්‍රිත තොරතුරු විශ්ලේෂණය කර තිබේ. බෙලිගල ග්‍රාමය තුළින් ලබා ගත් තොරතුරු එහි විග්‍රහ කොට ඇත. මෙහි බෙලිගල ගමෙහි භූගෝලීය පිහිටීමද, බෙලිගල ග්‍රාමයට එම නම ලැබීම පිළිබඳ මතවාදයන්ද, බෙලිගල ගමෙහි පැවැත්වෙන දළදා පෙරහැරෙහි ඓතිහාසික පසුබිමද, බෙලිගල පර්වතය පිළිබඳවද තොතුරු ආශ්‍රිතව කරුණු සාකච්ඡා කොට ඇත.

හතර වන පරිච්ඡේදය වෙන් කොට ඇත්තේ බෙලිගල ග්‍රාමය ආශ්‍රිතව පැවැත්වෙන පෙරහැර හා බැඳී පවතින සමාජ ව්‍යුහය හා සමාජ සංවිධානය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහාය. එම පරිච්ඡේදයේ අනු මාතෘකාවන් යටතේ බෙලිගල සමාජ ව්‍යුහය බෙලිගල ගමෙහි ක්‍රියාත්මක වන වැඩවසම් සංස්කෘතිය, පෙරහැර ආශ්‍රිත වෙනස්කම් හා සමාජ සංස්කෘත වෙනස්කම් අතර සබඳතාවය පිළිබඳව විශ්ලේෂණය කිරීමට උත්සාහ ගතිමි.

පර්යේෂණයේ පස් වන පරිච්ජේදය තුළ බෙලිගල ග්‍රාමය ආශ්‍රිත පෙරහැර හා බැඳී ඇති ජනප්‍රවාද, ජන විශ්වාස හා ජන ඇදහිලි පිළිබඳව ගැඹුරින් සාකච්ජා කෙරේ.

හය වන පරිච්ජේදයේදී බෙලිගල ගමෙහි ජනතාව අතර පවත්වාගෙන යන වෙනත් පුද පූජා විධි පිළිබඳ සාකච්ජා කෙරේ. එම මාතෘකාව යටතේ පත්තිනි දේවාල ආශ්‍රිත ප්‍රදේශයන්හි ඓතිහාසික වැදගත්කමද, පත්තිනි දෙවියන්ගේ උපත පිළිබඳවද, පත්තිනි දේවාලය ආශ්‍රිතව පවත්වාගෙන යන පුද පූජා පිළිබඳවද, බෙලිගල ගමෙහි ක්‍රියාත්මක වන ගැමි විශ්වාස අභිචාර විධි පිළිබඳවද ගැඹුරින් සාකච්ජා කෙරේ.

මෙම නිබන්ධනයේ අවසාන පරිච්ජේදය එනම් හත් වන පරිච්ජේදය වෙන් වී තිබෙන්නේ සමස්ථ පර්යේෂණ පිළබඳව සංක්ෂිප්ත වූ සමාලෝචනය ඉදිරිපත් කිරීමට හා පර්යේෂණ තොරතුරු වලට අනුව එළඹි නිගමනයන් හා යෝජනා ඉදිරිපත් කිරීම සඳහාය.